# 1. පශු සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය, අභිමථාර්ත සහ අරමුණු

## 1.1 පෙරවදන

පශු සම්පත, විශේෂයෙන්ම එළ ගව, මී ගව සහ එළුවන්, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආර්ථිකයේ සුවිශේෂිත ලෙස බද්ධවූ කොටසක් වේ. කෘෂි භෝග සහ පශු සම්පත් විශේෂයන් අතර දැඩි සහසම්බන්ධතාවයක් පවතින අතර, මෙම අංශ දෙකෙහි අන්‍යොන්‍ය සහයෝගීතාව උකහා ගැනීමෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආර්ථිකයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට මහත් පිටුවහලක් ලබාගත හැකි වනු ඇත.

සත්ත්ව නිෂ්පාදන පරිභෝජනය පසුගිය දශක දෙක තුළදී ඉතා සීඝ්‍ර අන්දමින් ඉහළ ගොස් ඇත. මෙහිදී කුකුළු නිෂ්පාදන පරිභෝජන අවශ්‍යතාවන් දේශීය නිෂ්පාදන මගින් සපයා ගෙන ඇතත්, කිරි හා කිරි නිෂ්පාදන භාවිතයන්ගේ අවශයතා විදේශ රටවලින් සපයා ගැනිමේ ප්‍රවනතාව වැඩිවෙමින් පවතී. කිරි නිෂ්පාදන ආනයනය සඳහා වැය වන මුදල, සමස්ථ ආහාර ද්‍රව්‍ය ආනයන පිරිවැයෙන් 1/5 ක් පමණ වේ. එමනිසා සත්ත්ව නිෂ්පාදන හා කිරි නිෂ්පාදන අවශ්‍යතා වලින් ස්වයංපෝෂිත වීම සඳහා රජය දැඩිලෙස කැපවී සිටී.

සත්ත්ව නිෂ්පාදන, ප්‍රජාවගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීමට උපකාරී වන අතරම, ඒවායේ අගය වැඩිකිරීම තුලින් ඉහළ වටිනාකමක් සහිත නිපැයුම් බවට පත්කිරීමට විවිධ ඉඩ ප්‍රස්ථා ලබා දෙයි. තවද, සම් ආශ්‍රිත කර්මාන්ත සඳහාද පශු සම්පත් සෘජු ලෙස දායක වන අතර, පශු සම්පත් අපද්‍රව්‍ය ජීව වායු උත්පාදනයට දායක වීම තුළින් රටේ බලශක්ති අවශ්‍යතාවන් යම් දුරකට පිරිමැසීමද ඉටු කරනු ලබයි. කිරි පට්ටි පාලනය හා සූකර පාලනය ආශ්‍රිතව සකසා ගත් ගෘහස්ථ ජීව වායු උත්පාදන තුළින් ග්‍රාමිය ශ්‍රී ලංකාවේ බලශක්ති අවශයතාවන් සඳහා විකල්ප ශක්ති ප්‍රභවයන් සාර්ථකව භාවිතා කළහැකි බව මේ වන විට සනාථ කර ඇත.

තවද ශ්‍රී ලංකා තත්වයන් යටතේ සත්ව පාලන කටයුතු බොහෝ විට ශ්‍රම සුක්ෂම ක්‍රියාවලීන් වන නිසාත්, ඉහතකී සුවිශේෂ ගුණාංග ප්‍රයෝජනයට ගනිමින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල රැකියා උත්පාදන කිරීමටත්, ජීවන තත්වයන් ඉහළ නැංවීමටත්, දිළිඳුකම තුරන් කිරීමටත්, පශු සම්පත ඉතා ඵලදායි ලෙස යොදා ගත හැක.

මේ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධණ හා සමාජ ස්ථායිතාව තහවුරු කරගැනීම පිණිස පශු සම්පත් ක්ෂේත්‍රයේ දායකත්වය ලබාගත යුතු ආකාරය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග පහත සඳහන් ආකාරයට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමු. තවද, මෙමගින් පශු සම්පත් සංවර්ධනය සඳහා රජයේ කාර්යභාරය පැහැදිළි ලෙස ඉදිරිපත් කිරීමටද එමගින් පුද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනය කෙරෙහි උනන්දුවක් දක්වන අන් සියළු පාර්ශවයන්ටත් පශු සම්පත් ක්ෂේත්‍රය තුළ තමන්ගේ කොටස පිළිබඳව වඩා යහපත් තීන්දු තීරණ ගැනීමට අවස්ථාවන් සැළසෙනු ඇත.

## 1.2 මූලධර්ම

i. ඉතා අහිතකර පරිසර තත්ත්වයන්හි ජීවත්වීමටත් ගුණාත්මක භාවයෙන් අඩු ආහාරයෙන් යැපීමට හැකිවන ලෙසත් දේශීය පශු සම්පත තාක්ෂණික ලක්ෂණ වලින් විශේෂයන් හැඩගැසී ඇත. මෙම සත්ත්ව විශේෂයන් සතු එවැනි ජාන සත්ව අභිජනන කාර්යයට අනාගතයේදී යොදා ගැනීම සඳහා සංරක්ෂණය කරනු ඇත.

ii. එසේම මධ්‍යම රජය හා පළාත් සභා සතු සත්ත්ව පාලනයට යෝග්‍ය පශු සම්පත් සත්ත්ව අභිජනන සහ පශු පර්යේෂණ කටයුතු වෙනුවෙන් සංරක්ෂණය කර තැබීම අවශ්‍ය බව පිළිගනු ලබයි.

iii. රටේ ආහාර සුරක්ෂිත භාවය තහවුරු කිරීම සඳහා පශු සම්පත් ක්ෂේත්‍රය සංවර්ධන කිරීම අත්‍යාවශ්‍ය කාර්යයක් වේ. මෙය සත්ත්ව නිෂ්පාදන සුලභ කිරීමට ඉවහල් වනවා පමණක් නොව පසේ සාරවත් භාවය දියුණු කිරීම තුලින් කෘෂි භෝගවල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහාත් ඉවහල් වනු ඇත.

iv. දේශීය සත්ත්ව ආහාර සඳහා අමුද්‍රව්‍ය නිෂ්පාදනය සිදුකරනුයේ ඉතාමත් අඩු කාර්යක්ෂමතාවයකිනි. එබැවින් ලාභදායී සත්ත්ව පාලනයක් සඳහා සත්ත්ව ආහාර අමුද්‍රව්‍ය සැපයුම කාර්යක්ෂම කිරීම අතිශයින් වැදගත් වනු ඇත.

v. කිරි පට්ටි කර්මාන්තය ජාතික ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේ වැදගත් අංශය බැවින් එයට රාජ්‍ය ආයෝජන සඳහා ප්‍රමුඛත්වය දෙනු ඇත. තවද බාධාවකින් තොරව පෞද්ගලික අංශයට මස් සඳහා සතුන් ඇතිකිරීමේ හා මස් නිෂ්පාදන සැකසීමේ කටයුතු වල නිරතවීමේ අවශ්‍යතාවද රජය පිළිගනු ඇත.

vi. පශු සම්පත් කර්මාන්තයෙන් බැහැරවී වඩා ආකර්ශනීය සහ සමාජ පිළිගැනීමක් ඇති ජීවිකාවන් සඳහා පුද්ගලයන් ඇදී යාමේ ප්‍රවණතාවක් දක්නට ඇත. මෙම ප්‍රවණතාවය නවතාලීමට සියළුම උත්සහයන් දැරිය යුතු අතර පශු සම්පත් ක්ෂේත්‍රයේ ඇති දිළිඳුකම පිටුදැකීමේ හැකියාවත්, ජීවන උපායන් වර්ධනය කිරීමේ හැකියාව සහ ආහාර සුරක්ෂිතතාව වැඩිකිරීමේ හැකියාව වැනි පශු සම්පත් කුසලතා ප්‍රයෝජනයට ගනු වස් තරුණ පරම්පරාවන් පශු සම්පත් කටයුතු සඳහා ආකර්ෂණය කරවීමට කටයුතු කළ යුතුය.

vii. පශු සම්පත් සංවර්ධනය සඳහා ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතන තවදුරටත් රජයේ පාලනය යටතේ මෙහෙයවනු ඇත. වාණිජමය කටයුතු වල නිරතව සිටින එවැනි ආයතන එකී කටයුතු ඉටුකරන පෞද්ගලික අංශයේ ආයතන වලට පරිපූරක ලෙස කටයුතු කරනු ඇත.

## 1.3. ප්‍රතිපත්තිමය අභිප්‍රායයන් සහ ඉලක්කයන්

- පශු සම්පත් සංවර්ධනය තුලින් තිරසාර සහ සමානාත්මක, ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ එකී නිෂ්පාදකයින්ට ලබාදීම
- තරඟකාරී මිළකට පාරිභෝගික ප්‍රජාව සඳහා දේශීය සත්ත්ව නිෂ්පාදන සුලභ කිරීම
- වසර 2015 වන විට කිරි අවශ්‍යතාවයන් ගෙන් 50% ක් දේශීය නිෂ්පාදනය තුලින් ලඟාකර ගැනීම

- වසර 2015 වන විට කුකුළු නිෂ්පාදන ප්‍රමාණය දෙගුණ කිරීම සහ සත්ව නිෂ්පාදන ආනයනික භාණ්ඩ හා තරගකළ හැකි තත්ත්වයට දේශීය සත්ව නිෂ්පාදන පත්කිරීම.

1.4. ප්‍රතිපත්තිමය අරමුණු

i. රට තුළ පශු සම්පත් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වන රජයේ කාර්ය භාරය පැහැදිලිව ප්‍රකාශ කිරීම හා එම ක්ෂේත්‍රය සඳහා රජයේ අභිප්‍රායන් ඉදිරිපත් කිරීම.

ii. පශු සම්පත් පාලනය, පශු නිෂ්පාදන සැකසීම හා අලෙවිය ඇතුළු සත්ව පාලන ක්ෂේත්‍රයේ ඇති විවිධ අවස්ථාවන් සඳහා පෞද්ගලික අංශය හා පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා උනන්දුවක් දක්වන අනෙකුත් කොටස්කරුවන් හට පහසුකම් සැළසීම.

iii. ජාතික අයවැය හරහා ඒකාබද්ධ අරමුදල මගින් සපයනු ලබන රාජ්‍ය ආයෝජන සහේතුක ලෙස පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා යොදාගැනීමටත්, පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා වන පෞද්ගලික අංශයේ ආයෝජන බැහැර වීම වැළැක්වීමටත් කටයුතු කිරීම.

## 2. ජාතික පශු සම්පත් සංවරධන ප්‍රතිපත්තිය

### 2.1 කිරිපට්ටි ක්ෂේත්‍රය

i. කිරි පට්ටි ක්ෂේත්‍රය, පශු සම්පත් සංවර්ධනය සඳහා වන රාජ්‍ය ආයෝජන සම්බන්ධයෙන් ප්‍රමුඛතම ක්ෂේත්‍රය වේ.

ii. දැනට සම්මත කිරි පාරිභෝගික වෙළඳ පොළ ප්‍රදේශයන්ගෙන් ඔබ්බට විහිදෙන දියර කිරි පරිභෝජන රටාවක් ප්‍රවර්ධනය කිරීම දේශීය කිරි සඳහා තරගකාරී වෙළඳපොළක් ඇති කිරීම සඳහා අවශ්‍ය පූර්ව සාධකයක් ලෙස පිළිගනී.

iii. කිරි පට්ටි සංවර්ධනයේදී දේශීය ගවයින්ගේ ආරය උසස් කිරීම අත්‍යාවශ්‍ය මූලධර්මයක් ලෙස සැලකේ. රාජ්‍ය ආයෝජනයේදී මේ සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙන අතරම ඒ සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීමද අත්‍යාවශ්‍ය කරුණක් ලෙස සැලකේ.

iv. කිරි නිෂ්පාදන කර්මාන්තය සඳහා කිරි ගවයන් වැඩිදියුණු කරන ආකාරයෙන්ම කිරි සඳහා වන මී ගවයන් සහ එළුවන් වැඩිදියුණු කිරීම තුලින් ද ගෘහාශ්‍රිත කිරි නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට ප්‍රයත්න දරනු ඇත.

v. දැනට යැපුම් මට්ටමේ පවතින කිරි නිෂ්පාදන කර්මාන්තය වාණිජමය මුහුණුවරක් සහිත තිරසාර තත්ත්වයට පරිවර්තනය කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය දක්වනු ඇත.

vi. දේශීය කිරි කර්මාන්තය සඳහා හිතකර වාතාවරණයක් ඇතිවන අයුරින් රාජ්‍ය බදු ප්‍රතිපත්තිය සහ කිරි නිෂ්පාදන ආනයන ප්‍රතිපත්තිය සකසනු ඇත.

vii. දේශීය කිරි සඳහා මිළ නියම කිරීම වෙළඳපොළ බලවේග මගින් පාලනය වීමට අවස්ථාව සලසන අතර එම බලවේග යහපත් තරඟකාරී තත්ත්වයකින් පවත්වාගෙන යාම තහවුරු කිරීම රාජ්‍ය අංශයේ කාර්ය භාරය වනු ඇත.

viii. දේශීය කිරි කර්මාන්තයේ දීර්ඝ කාලීන තිරසාර පැවැත්ම සඳහා වාණිජමය ලෙස ඵලදායීව පවත්වාගෙන යනු ලබන වාණිජමය මධ්‍යම පරිමාණ හා මහා පරිමාණ පෞද්ගලික කිරි පට්ටිකරුවන්ගේ සහභාගීත්වය අත්‍යාවශ්‍ය බව සැලකේ.

ix. කිරි ගොවියා ශක්තිමත් කිරීම සහ කිරි නිෂ්පාදනයන්හි අගය වැඩිදියුණු කරන ක්‍රියාදාමයන්හිදී කිරි ගොවීන්ගේ සහ කිරි නිෂ්පාදන සකස් කරන්නන්ගේ සක්‍රීය සහභාගීත්වය ලබා ගැනීම සඳහා පහසුකම් සලසනු ඇත.

## 2.2. කුකුළු පාලන ක්ෂේත්‍රය

i. කුකුළු පාලන අංශයේ වත්මන් ප්‍රගතිය සඳහා මූලික වශයෙන් හේතු සාධක වී ඇත්තේ පෞද්ගලික අංශයයි. මෙම අංශය එම ක්ෂේත්‍රයේ වර්ධනයේ නියමුවා ලෙස ඉදිරියේදිද කටයුතු කරනු ඇත.

ii. කුකුළු පාලනය පිළිබඳ රාජ්‍ය අංශයේ මූලික කාර්ය භාරය වනුයේ සත්ත්ව රෝග පාලනය,
නිෂ්පාදන කටයුතු සඳහා යෙදවුම්වල සහ නිෂ්පාදන භාණ්ඩයන්ගේ ගුණාත්මක භාවය තහවුරු කිරීම වැනි නියාමන කටයුතු වනු ඇත.

iii. නුමුහුන් කුකුළු ප්‍රභේද සහ මිශ්‍ර පරපුරේ කුකුලන් යොදා ගැනීම මගින් කෙරෙන
අභිජනන කටයුතු කුකුළු කර්මාන්තයේ දිගුකාලීන පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය ලෙස
සලකනු ඇත.

iv. නිරන්තරවම වර්ධනය වන මස් සඳහා වන පාරිභෝගිකයින්ගේ ඉල්ලුමට සුදුසුම
විකල්පය කුකුළු මස් නිෂ්පාදනය දියුණු කිරීම ලෙස සලකනු ලැබේ. සුදුසු කුකුළු ප්‍රභේද හා කුකුල් පාලන ක්‍රම හඳුන්වා දෙමින් කුකුළු ක්ෂේත්‍රයේ විවිධාංගකරණයක් ඇති කිරීම තුළින් ග්‍රාමීය වෙළඳපොළ ඉල්ලුමට විසඳුමක් ලබාදිම සඳහා රජය පහසුකම් සලසනු ඇත.

## 2.3 මාංශ නිෂ්පාදන අංශය

i. මස් කර්මාන්තයේ සංවර්ධනය සඳහා රාජ්‍ය මැදිහත්වීමක් නොකෙරෙනු ඇත. එසේ වුවත් රටතුල මස් පරිභෝජනය කරන ජනතාවක් වෙසෙන බවද රජය හඳුනාගෙන

ඇත. එමනිසා ඒ සඳහා අවශ්‍ය වන පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් සඳහා සීමාවන් නොකරන අතර, මස් නිෂ්පාදනයේ ගුණාත්මක සම්මතයන් සහතික කිරීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂණය තහවුරු කිරීම වෙනුවෙන් රජය වගකීම් දරනු ඇත.

ii. එමෙන්ම, ඌරන්, එළුවන්, බැටළුවන් සහ කුකුල් විශේෂ ද ඇතුළුව මස් සඳහා වන පශු සම්පත් විශේෂ සඳහා සුදුසු ජාන සංචිත සපයා දීමේ රජයේ සහභාගීත්වය තහවුරු කරනු ඇත.

iii. මස් සඳහා සතුන් නිෂ්පාදනයේදී, ප්‍රවාහනයේදී සහ ඝාතනයේදී සතුන්ගේ සුභසාධනය තහවුරු කිරීම සහ සත්ත්ව හිංසාව වැලැක්වීම ශිෂ්ඨ සමාජයක් සතු ප්‍රධාන වගකීමක් ලෙස සලකනු ඇත.

2.4 සත්ත්ව ආහාර සම්පත් අංශය

i. පෝෂ තෘණ වර්ග සහ අනෙකුත් ස්වාභාවික ගෝචර තෘණ මෙන්ම රළු ධාන්‍ය වර්ග, කෘෂිකාර්මික අපද්‍රව්‍ය සහ අතුරු නිෂ්පාදන ඇතුළු සත්ත්ව ආහාර සම්පත් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම සත්ත්ව පාලන ක්ෂේත්‍රය නංවාලීම සඳහා අතිශයින් වැදගත් බවට පිළිගැනෙනු ඇත.

ii. සත්ත්ව පාලන කර්මාන්තය සඳහා සත්ත්ව ආහාර සම්පත් දේශීයව වගා කිරීම සහ නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රමාණවත් වෙළඳපොළ ආරක්ෂණයක් සහ දිරිගැන්වීමක් සපයන අතරම, පශු සම්පත් කර්මාන්තය සඳහා අවශ්‍ය සත්ත්ව ආහාර අමුද්‍රව්‍ය අවශ්‍ය අයුරු සැපයීම පිණිසද රජය මගින් පහසුකම් සලසනු ඇත.

iii. කුකුල් කර්මාන්තයේ දක්නට ඇති පරිදි තිරසාර වූ වාණිජමය කිරි පට්ටි කර්මාන්තයක් ඇති කිරීම සඳහා සංයුක්ත සාන්ද්‍ර ගව ආහාර නිෂ්පාදනය කරනු ලබන කාර්යක්ෂම සංස්ථා අංශයක් ඇති කරවීම අත්‍යාවශ්‍ය බව සලකනු ඇත.

2.5 පශු සම්පත් සංවර්ධනය සඳහා පොදු ප්‍රතිපත්ති

i. පශු සම්පත් සංවර්ධනය සඳහා පශු පර්යේෂණ හා නිපැයුම්, මානව සම්පත් සංවර්ධන සහ ව්‍යාප්ති සේවා වැනි පොදු නිෂ්පාදන හා සේවා සඳහා රාජ්‍ය ආයෝජන ලබාදෙනු ඇත.

ii. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව දැනට පවත්නා ඉඩම් පෞද්ගලීකරණය කරනු නොලැබේ. එහෙත්, පශු සම්පත් සංවර්ධනය සඳහා වූ ක්‍රමවත් වැඩ සටහන් වෙනුවෙන් පෞද්ගලික සහ සංස්ථා අංශයන් උනන්දු කරවීම සඳහා රජයේ ඉඩම් ලබාදීම උනන්දු කරවනු ඇත.

iii. සත්ත්ව හා මානව ප්‍රජාවට තර්ජනයක්ව ඇතිකරනු ලබන, දැනට පවත්නා සහ අළුතෙන් ඇතිවෙමින් පවතින බෝවන රෝග බොහොමයක් සඳහා මූලාශ්‍රය වන්නේ සත්ත්ව විශේෂයි. එමනිසා මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා ශක්තිමත් කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනු ඇත.

iv. දේශීය පශු සම්පත් විශේෂයන්ගේ ජාන සංරක්ෂණය කිරීම සඳහා සක්‍රිය ලෙස සහයෝගය ලබාදෙන අතරම දේශීය සත්ත්ව විශේෂ වල ජාන සංවර්ධනය මගින් පශු සම්පත් අංශයේ ඵලදායීතාවය වැඩිදියුණු කළ හැකි බවද පිළිගනු ලබයි.

v. තමන් ඉටු කරන ක්‍රියාකාරකම් වලට අමතරව, සත්ත්ව අභිජනන කටයුතු, සත්ව ගොවිපල් පාලනය, උපදේශක සේවා සැපයීම, සත්ව රෝග හඳුනා ගැනීම හා ප්‍රතිකාර, ණය හා මූල්‍ය ආධාර සැපයීම, ආපදා රක්ෂණය වැනි කටයුතු වල නිරත වීම වැනි කාර්යයන් සඳහා ගොවි සංවිධාන, පශු සම්පත් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති ඇතුළු පෞද්ගලික අංශය දිරිගන්වනු ඇත.

vi. පළාත් සභා සහ අනෙකුත් පෞද්ගලික අංශයන් වැනි ආයතන ද, පශු සම්පත් අංශයේ සංවර්ධනය සඳහා බොහෝ දුරට සම්බන්ධ වී ඇත. එම ආයතන වල ක්‍රියාකාරකම් සම්බන්ධීකරනය කිරීම මගින් මෙම ක්ෂේත්‍රයට විවිධාකාරයෙන් සම්බන්ධ අය අතර මනා සමායෝජනයක් පශු සම්පත් සංවර්ධන අංශය භාර අමාත්‍යාංශය විසින් සිදුකරනු ඇත.

vii. ග්‍රාමීය කෘෂිකර්ම සංවර්ධනය සඳහා පශු සම්පත් සංවර්ධනය පරිපූරක ලෙස බලපාන සාධකයකි. එබැවින් සමස්ථ ග්‍රාමීය සංවර්ධනයට සාධනීය ලෙස දායක වීම සඳහා සත්ව පාලන ක්‍රියාවලීන්ට බැඳී ඇති ඉදිරි හා පශ්චාත් සම්බන්ධතා ප්‍රශස්ථ මට්ටමින් පැවැත්වීමට හැකි අයුරින් කටයුතු කරනු ඇත.

viii. දේශීය පශු සම්පත් කර්මාන්තයට අහිතකර ලෙස බලනොපාන අයුරින් පරිභෝජනය සඳහා වන සත්ත්ව නිෂ්පාදන ආනයනය කිරීමේ ක්‍රමඋපායන් සැකසෙන අතර, විශේෂිත තත්ත්වයන් සලකා බැලීමෙන් අනතුරුව සත්ව නිෂ්පාදන අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා විවිධ නිපැයුම් කර්මාන්ත සඳහා පමණක් අවශ්‍ය වන සත්ත්ව නිෂ්පාදන ආනයනය සඳහා ඉඩ හරිනු ඇත.

ix. එමෙන්ම ජීවී සතුන්, ශුක්‍රානු, ජෛව නික්ෂේපන සහ කළල ආනයනය සඳහා අවහිරතා නොපනවන අතරම, එවැනි කාර්යයන් සඳහා වන නියාමන රීති වලට අනුකූලව ආනයනය කිරීමට ඉඩ දෙනු ඇත.

x. මහජන අවශ්‍යතා සඳහා ඵලදායි ලෙස පශු සම්පත් සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස සලකනු ඇත.